අඹන්ගඟකෝරලේ ප්‍රාදේශීය සභාව

<u>මාතලේ දිස්ත්‍රික්කය</u>

1. මූල්‍ය ප්‍රකාශන

---------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජුනි 28 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට අඹන්ගඟකෝරලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

සේවක ඇප ආයෝජන මුදල වූ රු.53,469 ක් ශේෂ පත්‍රයේ ආයෝජන යටතේ නොදක්වා ණයගැතියන් යටතේ දැක්වීම හේතුවෙන් එම වටිනාකමින් ණයගැති ශේෂය වැඩියෙන් හා ආයෝජන ශේෂය අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

(අ) ලැබිය යුතු ගිණුම්

--------------------

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 7 ක වටිනාකම රු.3,945,160 ක් වූ අතර, ඉදිරිපත් කරන ලද කාල විශ්ලේෂණයට අනුව ඊට වර්ෂ 3කට වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොවූ රු.137,871 ක ශේෂ ඇතුළත්ව තිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

---------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතු ණයහිමි ගිණුම් ශේෂ 8 ක වටිනාකම රු.2,636,726 ක් විය. ඉදිරිපත් කරන ලද කාල විශ්ලේෂණය අනුව වර්ෂ 3 කට වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොකර පවතින එකතුව රු.1,531,401 ක් වූ ශේෂ ඊට ඇතුළත්ව තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට යැවිය යුතු රු.813,670 ක දායක මුදලක් පැවති අතර, වර්ෂ 8 කට වැඩි කාලයක සිට පැවත එන රු.626,974 ක ශේෂයක් ද ඊට ඇතුළත් වී තිබුණි.

1.3.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම.

-------------------------------------------------------

තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම.

---------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 3,839,413 ක් වූ ගිණුම් විෂයයන් 5 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.4 අනුකූල නොවීම්

--------------------

නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්.

--------------------------------------------------------------------------

නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 197හා 199 | එක් එක් මාසය අවසානයේදී පාරිභෝජන ගබඩා ද්‍රව්‍ය ලේඛනය පරීක්ෂා කිරීමෙන් පසු ලේකම්වරයා විසින් අත්සන් යෙදීම හා ලැබීම් සටහන් කරනු ලබන පැත්තේ සෑම සටහනක්ම ඉදිරියෙන් භාණ්ඩය සඳහා මුදල් ගෙවන ලද වවුචරයේ අංකය හා දිනය සඳහන් කර නොතිබුණි. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | ප්‍රාදේශීය සභාව සතු වාහන 03 ක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,541,806 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.990,615 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

-------------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | 2016 රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | කුලී | 13,000 | 96,600 | 90,655 | 24,590 | 160,000 | 142,400 | 123,755 | 19,045 |
| (ii) | බලපත්‍ර | 36,000 | 298,600 | 298,600 | - | 250,000 | 245,280 | 245,280 | - |
| (iii) | වෙනත් ආදායම් | 471,600 | - | 2,128,520 | - | 4,374,500 | - | 2,516,498 | - |

2.2.1 අක්කර බදු

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.47,933 ක හිඟ ශේෂයක් පැවතුණි. ඒ තුළ පුද්ගලයන් 65 දෙනෙකුගෙන් අයවිය යුතු වර්ෂ 2 ක් ඉක්මවූ රු.38,271 ක හිඟ ශේෂයක්ද විය.

2.2.2 කුලී

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.31,550 ක හිඟ ශේෂයක් පැවතුණි. ගුරුබැබිල අංක 01 කඩ කාමරය වෙනුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.23,850 ක මුදල 2018 ජනවාරි 17 දිනය වන විටද, අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

2.2.3 ජල ගාස්තු

සභාව සතු ජල යෝජනා ක්‍රම 07 හි 2017 දෙසැම්බර් 31 දිනට හිඟ ජල ගාස්තු ආදායම රු.454,748 ක් වූ අතර, ඒ තුළ ජල පාරිභෝගිකයින් 26 දෙනෙකුගෙන් අයවිය යුතු වර්ෂ 2 ක් ඉක්මවූ රු.31,395 ක ශේෂයක්ද විය.

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් නිලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.60,750 ක් හා මුද්දර ගාස්තු රු.3,043,550 ක් විය.

2.3 අධිභාර

ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවලුන්ට එරෙහිව මවිසින් ඉකුත් වර්ෂ වලදී පනවන ලද අධිභාර වලට අදාළව 2017දෙසැම්බර් 31 දිනට රු.1,408 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය,පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම , ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) කර්තව්‍යයන් ඉටු නොකිරීම
------------------------------

(i) 2017 අයවැය ලේඛනය අනුව බල ප්‍රදේශය පුරා අවශ්‍ය ස්ථානවල වීථි ලාම්පු සවි කිරීම, මගීන්ගේ පහසුව සඳහා බස් මගී ආවරණ ස්ථාපිත කිරීම, සභාවට අයත් සියලුම සුසාන භූමි හා ඒවායේ ඇති ගොඩනැගිලි විධිමත් කිරීම හා පානීය ජල පහසුකම් වැඩිදියුණු කිරීම යන කාර්යයන් ඉටුකර ප්‍රදේශයේ ජනතාවගේ පොදු පහසුකම් වැඩිදියුණු කිරීමට සැලසුම්කර තිබූ නමුත් එකී කාර්යයන් ඉටුකර නොතිබුණි.

(ii) 2017 වර්ෂයට පිළියෙල කර ඇති සංවර්ධන සැලැස්ම අනුව ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කළයුතු බවට හඳුනාගෙන තිබූ ඇස්තමේන්තුගත වටිනාකම රු.15,000,000 ක් හා රු.7,200,000 ක් වූ මාර්ග 11 ක හා ගොඩනැගිලි 4 ක සංවර්ධන කටයුතු සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම
--------------------------------------------

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ කළුගඟ ජල ව්‍යාපෘතිය ආශ්‍රිතව ළිඳක් ඉදිකර වසම් 5 කට ජලය ලබාදීමේ ව්‍යාපෘතියේ ඉතිරිවැඩ නිම කිරීම සඳහා රු.23,161,262 ක මුදලක් 2017 සැප්තැම්බර් 11 දිනැතිව අනුමත කර 2017 දෙසැම්බර් 11 දිනට පෙර අවසන් කිරීමට යෝජනා කර තිබුණද, ප්‍රමාද වී ප්‍රතිපාදන අනුමත කිරීම මත ව්‍යාපෘතිය ඉටු කිරීමට ප්‍රමාණවත් කාලයක් නොවීමෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.
තවද පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන ප්‍රජා ජල ව්‍යාපෘති ප්‍රතිපාදන යටතේ රු.1,689,451 ක් වැයකර 2016 වර්ෂයේදී ඉදිකර තිබූ මෙම ව්‍යාපෘතියේ ළිඳ හා පොම්පාගරය වර්ෂයකට වැඩි කාලයක් නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක
-----------------------------

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව විධිමත් පරිදි දැනුවත්ව නොතිබීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බලප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගු කාලීන සැළසුම් 2018 ජූනි 8 දින වන විටත් සකස්කර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා
-----------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) සභාව සිය බල ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය ප්‍රරෝහණය කිරීමේ හා ආරක්ෂා කිරීමේ පොදු පරිපාලන අධිකාරිය ලෙස කටයුතු කළයුතු වුවත්, 2002 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලය තුළ ආරම්භ කළ ප්‍රතිලාභී පවුල් 550 කට ජලය බෙදා හරින ජල ව්‍යාපෘති 8 ක ජලයේ යෝග්‍යතාවය පිළිබඳව විධිමත් පරිදි ජල සාම්පල පරීක්ෂා කිරීමක් කිසිදු අවස්ථාවක සිදුකර නොතිබුණි.

(ආ) අවසන් ගිණුම සමඟ ඉදිරිපත් කර ඇති තැන්පත් උප ලේඛනයේ දක්වා ඇති 2009 හා 2010 වර්ෂවල සිට පැවත එන රු.311,833 ක් වටිනා තැන්පත් ශේෂ 11 ක තොරතුරු හඳුනාගෙන නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

ප්‍රාදේශීය සභාව සඳහා අනුමත තනතුරු 08 ක පුරප්පාඩු 12 ක් දීර්ඝ කාලීනව පැවතීම සභාව තුළින් ඉටු කළයුතු මහජන සේවාවන් සීමා වීමට හේතු වී තිබුණි.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 2017 වර්ෂය තුළ සභාබල ප්‍රදේශය තුළ ඇති සියලු ව්‍යාපාර පිළිබඳව සමීක්ෂණයක් විධිමත් පරිදි සිදුකර ලේඛනගත කිරීමක් සිදුනොකර වෙළඳ බලපත්‍ර ලබා ගැනීම සඳහා ඉදිරිපත් වන අයදුම්පත්‍ර පමණක් ලේඛනගත කර තිබුණි.

(ආ) 2016 වර්ෂයේ වෙළඳ බලපත්‍ර ලබාගෙන තිබූ ව්‍යාපාර 15 ක් 2017 වර්ෂයට අදාළ වෙළඳ බලපත්‍ර ලබාගෙන නොතිබූ අතර, එම ව්‍යාපාර වසා දමාතිබේද ,බලපත්‍ර ලබා නොගෙන ව්‍යාපාර කටයුතු කරන්නේද යන්න හඳුනාගෙන නොතිබුණි.

3.5 වත්කම් කළමනාකරණය

-----------------------------

3.5.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

------------------------------------------

සභාව විසින් 2016 වර්ෂයේ සිදුකර තිබූ වත්කම් සමීක්ෂණය අනුව සුසාන භූමි 04 ක් පිළිබඳ තොරතුරු හඳුනා ගැනීමට නොහැකි වී තිබූ අතර, හඳුනාගෙන ඇති සුසාන භූමිවලද නිවැරදි වැට මායිම් නොමැති වීම හා මැනුම් කටයුතු කර පිඹුරුපත් සකස්කර නොමැති වීම නිසා නිශ්චිතව ඉඩම් ප්‍රමාණයන් හඳුනා ගැනීමට අපහසු වී තිබුණි.

3.5.2 වත්කම් ලේඛනගත නොකිරීම

-------------------------------

සභාව සතු මාර්ග අවසන් වරට ගැසට් කර තිබුණේ 1996 මාර්තු 22 වන අතර මාර්ග ලේඛන යාවත්කාලීන කර නොතිබුණි.

3.5.3 පවරා නොගත් වත්කම්

-------------------------

ප්‍රාදේශීය සභාව විසින් දීර්ඝ කාලයක සිට පරිහරණය කරමින් පවතින වාහන 5 ක හිමිකම පවරාගෙන ප්‍රාදේශීය සභාව නමින් ලියාපදිංචි කිරීමට කටයුතු කර නොතිබුණි.

3.5.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

----------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතුව පවතින විදුලි ජනක යන්ත්‍රයක් හා වාහන 6 ක් නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) පුරනැඟුම සම්මන්ත්‍රණ ශාලාව 2017 වර්ෂයේදී එක් අවස්ථාවක පමණක් කුලියට ලබාදී රු.3,000 ක පමණ ආදායමක් උපයා තිබූ අතර වර්ෂය පුරා ඌන උපයෝජිතව පැවතුණි.

(ඇ) සභාව සතුව පවතින කඩ කාමර 02 ක් 2016 වර්ෂයේ සිට වසා දමා තිබුණි.

3.6 ප්‍රසම්පාදනය
--------------
ප්‍රසම්පාදන සැලැස්ම
----------------------
රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 හා 4.2.2 අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක්, සිවිල් වැඩ, භාණ්ඩ හා වෙනත් සේවා ඇතුළත් සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් හා ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙල කර නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
------------------------------------
4.1 අයවැය පාලනය
--------------------
විස්තර පහත දැක්වේ.

(අ) ආදායම් විෂයයන් 9 කට අදාළ රු.67,000 ක් වූ ඇස්තමේන්තුගත ආදායම් කිසිවක් උපයා නොතිබුණි.

(ආ) ආදායම් විෂයන් 10 ක ශුද්ධ ප්‍රතිපාදනය හා තථ්‍ය ආදායම අතර, විචලනයේ ප්‍රතිශතය සියයට 30 සිට සියයට 98 ක් අතර පරාසයක විය.

(ඇ) වියදම් විෂයන් 16 කට අදාළ රු.400,000 කින් කිසිදු වියදමක් නොදරා සම්පූර්ණ ප්‍රතිපාදන මුදලම ඉතිරිකර තිබුණි.

(ඈ) වැය විෂයන් 21 ක අයවැයගත ප්‍රතිපාදන මුදලින් වෙනත් වැය විෂයන්ට මාරුකිරීම් සිදුකළ පසුව ශුද්ධ ප්‍රතිපාදන මුදලින් සියයට 33 සිට සියයට 96 දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

4.2 විගණන හා කළමනාකරණ කමිටු
-----------------------------------
2014 අගෝස්තු 08 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක සීපීසී/සීඑල්ජී/1/9/1/4 දරන ලිපිය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පවත්වා තිබුණද ආයතනයේ දුර්වලතා මගහරවා ගැනීම සඳහා ඵලදායී අයුරින් එම කමිටු තීරණ උපයෝගී කරගෙන නොමැති අවස්ථා පැවතුණි.

5. පද්ධති හා පාලනය
---------------------
විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | මානව සම්පත් කළමනාකරණය | | අනුමත තනතුරුවල පුරප්පාඩු පැවතීම. |
| (ආ) | වත්කම් කළමනාකරණය | (i) | වත්කම් ඌන උපයෝජිතව හා නිෂ්ක්‍රීයව පැවතීම. |
| | | (ii) | වත්කම්වල අයිතිය තහවුරු කර නොගැනීම. |
| (ඇ) | අයවැය පාලනය | (i) | ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබීම. |
| | | (ii) | ආදායම් ඉලක්ක සපුරා නොගැනීම. |